ද මැසිනොද් විදුහල, කඳාන

# නාට්‍ය හා රංග කලාව

Learning Resource Center
De Mazenod College
Kandana
2016 . 03 . 29

පළමු වාර පරීක්ෂණය 2016 — 6 ශ්‍රේණිය

---

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න

1) ජනතාව අතර පවතින් කථන්දර හඳුන්වන්නේ
   1. බණ කථා
   2. ජන කථා
   3. කෙටි කථා
   4. කට කථා

2) අප දන්නා ජන කථාවකි
   1. ආගමික කථා
   2. මහදැනමුත්තාගේ කථා
   3. නව කථා
   4. නරියා හා මිදි වැල

3) කථාවක් කියන්නා තුල තිබිය යුතු සුදුසු කමකි
   1. නිවැරදිව වචන උච්චාරණය
   2. රසවත් ලෙස රඟ පාමින් කිම
   3. ශ්‍රාවකයා තුල චිත්ත රූප මැවෙන ලෙස කිම
   4. ඉහත සියල්ලම තිබීම

4) වැරදි කියමනට ඉර ගසන්න
   1. ජනකථා නිර්මාණ කළ අයගේ නම් නැත
   2. ජනකථා එක් පුද්ගලයෙකු විසින් නිර්මාණය කර ඇත
   3. කථා අසන්නට කවුරුත් කැමතිය
   4. සෑම කථාවකම තේමාවක් ඇත

5) ජන කථාවක් රසවිඳිය හැකි ක්‍රම දෙක තෝරන්න
   1. නැවතිමක් නොමැතිව හා ශබ්ද නගා කියවීම
   2. කථාව බලා කියවීම හා අසා සිටීම
   3. කථාව අසා හා බලා නොසිටීම
   4. කථාව රඟ පෑම හා කියවාගෙන යාම

6) හිස්තැනට සුදුසු වචනය තෝරා ලියන්න වචන පහත දැක්වේ
   1. කථා කියවන්නා අසන්නාට .............................. සේ කිව යුතුය
   2. කථාන්දරයක් .............................. බවට පත් කළ හැක
   3. යම් දෙයක් දෙස බලා ඒ අයුරින් කිරීම .............................. යයි
   4. මිනිස් හා .............................. හැසිරීම් අනුකරණය කළ හැක
   5. .............................. ආශ්‍රිතව සිදුවීම් නාට්‍යයක් බවට පත් කළ හැකිය
   6. රඟ දැක්වීම .............................. යයි
   7. මිනිස් හැසිරීම්වල .............................. චලන අනුකරණය කළ හැක
   8. අපට අනුකරණය කළ හැකිය ..............................
   9. අත්දැකීම් ඇසුරින් .............................. නිර්මාණ කළ හැකිය
   10. මිනිස් චරිතවලට වඩා .............................. චරිත ද අපට රඟපා දැක්විය හැක

( නාට්‍යයක්, අධි මානුෂික, පරිකල්පන, සත්ව චර්යා, බාහිර, අණුකරනයයි, පරිසරය, සත්ව, පැහැදිලි වන, අභිනය )

7) මේ කියමන නිවැරදි නම් √ ද වැරදි නම් X සලකුණ වරහන් තුල යොදන්න

1. සෝමලතා සුබසිංහ මහත්මිය ළමා නාට්‍ය ලියා ඇත ( )
2. මනමේ නරි බැනා ළමා නාට්‍ය දෙකකි ( )
3. කතන්දර කියන ශෛලියක් ඇත ( )
4. ජනකථා ජන ප්‍රවාද වලින් ආවකි ( )
5. මිනිස් හා සත්ව බාහිර චලන අපට අනුකරණය කළ නොහැකිය ( )
6. අප තුළ පරිකල්පනය නැත ( )
7. පරිසරය ඇසුරින් නිර්මාණය කළ හැක ( )
8. රඟ පැම රූපණයයි ( )
9. දෙවියන් අධිමානුෂික නොවේ ( )
10. පෙර සුදානමකින් තොරව රංගනය ක්ෂණික නිරූපන යයි ( )

## II කොටස

ප්‍රශ්න 6 කට පිළිතුරු සපයන්න

1) නරියා හා පැපොල් ගෙඩිය සම්බන්ධ කර කථාවක් නිර්මාණය කරන්න

2) දෙවියෝ බිමට බැස පාරේ ඇවිදගෙන යන විට දෙවියන්ට පරිසරය ගැන සිතෙන දේවල් ලියන්න

3) ඔබගේ වයසේ ළමයෙක් ඔබ ළගට පැමිණ කැමට යමක් ඉල්ලයි ඔබගෙන් ළමයාගෙත් දෙබස ලියන්න

4) දැන් රෑ 10 යි බල්ලා බුරයි ඔබ තනියම නිවසේ ගේ වටේ ශබ්ද ඇසේ මල් පෝච්චි පෙරළී යයි ගේ දොරකඩ කවුද ඇත මේ සියල්ල ගෙන පොඩි කථාවක් ගොතන්න

5) පරිසරයේ ඔබ දකින රිද්ම හා රටා අඳින්න

6) මානුෂිය හා අධිමානුෂිය මුහුණු 2 ක් අඳින්න

7) තද පෑවුම ගැන කුඩා කවියක් ලියන්න

8) අභිරූපණ රග පැම යනු කුමක්ද?

9) බාහිර චලන යනු මොනවාද?